# සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල

# රෙගුලාසි මාලාව

# 2023.05.02

**සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල**

**සමාජ සංවර්ධන අංශය**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**
4 මහල, සෙත්සිරිපාය
**බත්තරමුල්ල.**

# දර්ශනය

### සියළු සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක්

# මෙහෙවර

**සමෘද්ධි ප්‍රතිලාභී පවුල් අතර නිවාස ලොතරැයි දිණුම් ඇදීමක් මාසිකව ක්‍රියාත්මක කොට පවත්වාගෙන යමින් එම පවුල් සඳහා ස්ථිර නිවසක හිමිකම ලබාදීම, නිවාස හිමි ප්‍රතිලාභීන්ගේ නිවාස වැඩිදියුණු කිරීම, නිවසක් සාදා ගැනීමට ඉඩමක් මිලදී ගැනීම හා ඔවුන් ආර්ථික, සාමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරීම තුලින් අධ්‍යාත්මික ගුණ වගාවන් සංවර්ධනය කිරීම**

# ඉලක්ක

**01.** සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක්ම සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිණුම් ඇදීමේ වැඩසටහනට දායක කර ගැනීම

**02.** සෑම මසකම සමෘද්ධි ලොතරැයි දිණුම් ඇදීමක් සිදුකොට ප්‍රතිලාභී පවුල් **335**ක් සඳහා රු. ලක්ෂ **2** බැගින් නිවාස ත්‍යාග **335**ක් ලබා දෙමින් වාර්ෂිකව පවුල් **4,020**ක ගේ නිවාස ප්‍රශ්ණය විසඳීම තුළින් ප්‍රතිලාභී පවුල්වල ස්ථිර නිවාස ප්‍රශ්ණයට තිරසාර විසඳුමක් ලබාදීම

**03.** මාසිකව පිරිනමන නිවාස දිණුම් **335** ලබා දීමෙන් පසු ඉතිරි වන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට යොදා ගැනීම හා දේශීය මුදල් වෙළඳපලේ වඩාත් පලදායී ලෙස ආයෝජනය තුලින් ලැබෙන ආදායම යලිත් මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට යොදා ගැනීම

# පරමාර්ථ

**01.** සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සුභසාධනය වැඩි කිරීම සඳහා ඔවුන්ගේ තාවකාලික නිවාස ප්‍රශ්ණයට ස්ථීරසාර විසඳුමක් ලබාදීම

**02.** සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම

**03.** සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ස්ථීර නිවාස ප්‍රශ්ණය විසඳීම තුළින් ඔවුන් ආර්ථික සමාජීය අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාත්මික ගුණ වගාවන් දියුණු කිරීම

**04.** ජයග්‍රාහී ප්‍රතිලාභියා ස්ථීර නිවසකට හිමිකම් කියන අවස්ථාවලදී ප්‍රතිලාභියාගේ ආර්ථික තත්ත්වය නඟාසිටුවීම සඳහා සුදුසු ව්‍යාපෘති වලට යොමු කිරීම

**05.** සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම වෙනුවෙන් කටයුතු සම්පාදනය කිරීම හා අවශ්‍ය ප්‍රතිපාදන ඇරීම

## සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල රෙගුලාසි මාලාව

2013 අංක 01 දරණ දිවි නැගුම පනතේ 45 වැනි වගන්තිය මගින් සලසා ඇති කරුණු අනුව 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරි පනත යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස අරමුදල යටතේ නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීම පවත්වා ගෙන යායුතු වන්නේය.

01. මෙම ලොතරැයිය "සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයිය" නමින් මින් මත්තට භාවිතා කරනු ලැබිය යුතු වන්නේය.

02. සමෘද්ධි ලොතරැයිය දිනුම් ඇදීම සඳහා ඉලක්ක ගත කණ්ඩායම වනුයේ සියලුම සමෘද්ධි සහනාධාරලාභී පවුල්ය. දැනට 3,500/-, 2,500/-, හා 1,500/-, වශයෙන් වූ සහනාධාර පවුල් මීට ඇතුලත්ය.

03. 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 45 වගන්තියේ සඳහන් පරිදි සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීම ජාතික ලොතරැයි මණ්ඩලයේ සහාය ඇතිව සිදු කළයුතු වන්නේය.

04. දැනට පවත්වාගෙන යනු ලබන නිවාස සංවර්ධන අරමුදල එසේම පවත්වාගෙන යායුතු වන්නේය.

05. නිවාස සංවර්ධන භාරකාර අරමුදල් මණ්ඩලයේ හා ජාතික සභාවේ තීරණය හා අනුමැතියට යටත්ව සහනාධාර වටිනාකමින් මසකට රු. 100/-ක මුදලක් 2022 ජුනි මස සිට අය කිරීමට තීරණය වී ඇත. මෙතෙක් ත්‍යාග ලෙස ලබාදුන් රු. 150,000/-ක මුදල 2016 ජනවාරි මාසයේ සිට රු. 200,000/- දක්වා වැඩිවන අතර මාසිකව ලබාදෙන ත්‍යාග සංඛ්‍යාව 335 දක්වා වැඩිකළ යුතු වන්නේය .

06. සෑම නිවාස ලොතරැයි ජයග්‍රාහකයකුම අදාල කාලය තුල සමෘද්ධි සහනාධාරලභියකු විය යුතු අතර, එකී සහනාධාර මුදලින් 2022 ජුනි මස සිට සෑම මාසයක් සඳහාම නිවාස ලොතරැයි දායකමුදල් වන රු. 100/- ගෙවා තිබිය යුතු වන්නේය.

07. සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදලට සියලුම සහනාධාරලාභි පවුල් වලින් රුපියල් 100/-ක මුදලක් සෑම මසකම ඔවුන්ගේ සහනාධාර මුදලින් අඩුකොට සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දායක මුදල් වශයෙන් සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදලට බැර කර ගැනීම ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් කළ යුතුය.

08. නිවාස සංවර්ධන අරමුදලට බැරවන මුදලින් මාසිකව දිනුම් අදිනු ලබන ලොතරැයි 335 ට අමතරව සමෘද්ධි සඳහා බලපානු ලබන ආර්ථික , සමාජීය, අධ්‍යාත්මික හා සංස්කෘතික කටයුතු සඳහා නිවාස සංවර්ධන අරමුදල් භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වැය දැරීමට බලය පැවරෙන්නේය.

09. සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදලට බැරවන මුදල් මෙම අරමුදලේ පරිපාලන හා සංවර්ධන වියදම් සඳහා ද ඉතිරි මුදල්වේනම් ඒවා අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනිම සඳහා ද, අරමුදල් වර්ධනය කර ගැනීම සඳහා ආයෝජනය කිරිම සඳහා ද, යොදාගත හැකිවන්නේය.

10. මෙම අරමුදල පාලනය කිරිම සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදල් භාරකාර මණ්ඩලය විසින් කළයුතු වන්නේය. මෙහි සංයුතිය 2002 ජුනි මස 06 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ ඇ වගන්තියේ සඳහන් පරිදි මෙම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් සමෘද්ධි විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද සෙසු සාමාජිකයන් වශයෙන් ,

- සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාද ,
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ද,
- සමෘද්ධි දෙපාර්තමේන්තුවේ සුභසාධන (සහනාධාර) අංශයේ අධ්‍යක්ෂවරයාද,
- සමෘද්ධි විෂය භාර අමාත්‍යාංශයේ නම් කළ තවත් එක් නියෝජිතයෙක් ද පත් කළයුතු වන්නේය.

2005 පෙබරවාරි මස 10 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව,

- සමස්ථ ලංකා සමෘද්ධි කළමනාකරුවන්ගේ සංගමයේ නියෝජිතයෙක්ද,
- සමස්ථ ලංකා සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී සංගමයේ නියෝජිතයෙක්ද පත්කළ යුතු වන්නේය.

11. සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදල් භාරකාර මණ්ඩලය විසින් අරමුදලේ සියලුම ලැබීම් හා ගෙවීම් පිළිබඳ තිරණ ගනු ලබන අතර, එකී අරමුදල සංවර්ධනය කිරිම සඳහා වූ සියලු තිරණ හා පියවර එකී භාරකාර මණ්ඩලය විසින් කලින් කලට තිරණය කළ යුතු අතර, සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදිමට අමතරව එකී භාරකාර මණ්ඩලයට

හැගෙන මෙම අරමුදලේ පරමාර්ථ වලට අනුකූල වන්නා වූ ව්‍යාපෘති එකී අරමුදලේ මූල්‍ය හා නෛතික ප්‍රතිපාදන භාවිතා කොට සිදු කළ හැකිවන්නේය.

12. සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් තෝරා ගනු ලබන පරිසනක වැඩසටහන් සම්පාදන ආයතනයක් මඟින් සකසා ගන්නා ලද පරිසනක වැඩ සටහනක් ආශ්‍රයෙන් සිදුකළ යුතු වන්නේය.

13. මෙකී ලොතරැයි දිනුම් ඇදිම සඳහා සියලුම දිස්ත්‍රික්කවල සිටින සහනාධාර ලාභී පවුල්වල ගෘහමූලිකයාගේ  නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ පිළිගත හැකි වැඩිහිටි හැඳුනුම්පත් අංකය යන විස්තර ඇතුලත් පරිසනක දත්ත පද්ධතියක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වාගෙන යායුතු වන්නේය.

14. ප්‍රතිලාභී නාමලේඛන පරිසනක ගත කිරිම සඳහා දිමනාවක් ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතිය යටතේ ලබාගත හැකිය . එසේම මින් ඉදිරියට සමෘද්ධි නිවාස ලොතරැයිය පවත්වාගෙන යාම සඳහා වු ඍජු පරිපාලන වියදම් ලොතරැයි භාරකාර මණ්ඩලය තීරණය කරනු ලබන ප්‍රමාණයක් ඉහත අරමුදලින් වැය කිරිමට බලය ඇත්තේය.

15. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සකසන ලද සහනාධාරලාභීන්ගේ විස්තර ඇතුලත් පරිසනක දත්ත සමුදාය තුලින් ඒ ඒ ප්‍රතිලාභී පවුල් සඳහා නිවාස සංවර්ධන ලොතරැයි අංකයක් අහඹු ලෙස ලබා දිය යුතු වන්නේය.

16. සෑම මාසයක් සඳහාම සිදුකරනු ලබන දිනුම් ඇදිමක් මගින් එක් ත්‍යාග ලාභියකුට රුපියල් 200,000/- ක් බැගින් ත්‍යාග 335ක් පිරිනමනු ලැබිය යුතුවන්නේය. මෙම දිණුම් ඇදීම මසකට වරක් හෝ කළහැකිය.

17. සෑම දිනුම් ඇදීමකටම පෙර ඒ ඒ මාසයේ සමෘද්ධි සහනාධාරයෙන් ඉවත් වූ සහ අලුතින් සහනාධාර ලැබූ ප්‍රතිලාභීන්ගේ තොරතුරු පරිසනක දත්ත සමුදායට ඇතුලත් කර යාවත්කාලීන කළ යුතුය.

18. සෑම දිණුම් ඇදීමක්ම සිදු කිරීමෙන් පසු ජයග්‍රාහී අංක ඇතුලත් ප්‍රතිලාභී නාම ලේඛනය ප්‍රධාන රූපවාහිනී නාලිකාවක් මගින් විකාශය කොට එක් එක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත එකී ජයග්‍රාහී අංක ප්‍රතිලාභීන් වෙත දැන්වීම සඳහා නිල ප්‍රථිපල දන්වා යැවිය යුතු

වන්නේය. මෙම නිල ප්‍රතිඵල පුවත්පත් මගින් සිංහල හා ද්‍රවිඩ භාෂාවන්ගෙන් ප්‍රසිද්ධ කළයුතු අතර එසේ තොරතුරු යාවත්කාලීන කිරීමේදී සිදුවන දෝෂයක් මත අදාල දිනුම් අදින කාල පරිච්ඡේදයට සහනාධාර නොලබන අයෙකුට ජයග්‍රහණයක් හිමි වුවහොත් ඒ සඳහා ඔහුට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ යැපෙන්නෙකුට හෝ කිසිදු අයුරෙකින් වත් හිමිකම් කිව නොහැකි වන්නේය.

19. ජයග්‍රාහි ප්‍රතිලාභින් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීමේදි ප්‍රාදේශිය ලේකම් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ත්‍යාග මුදල් නිදහස් කළ යුතු වන්නේය.

20. ළමා නිවාස, මහලු නිවාස, හෝ පිරිවෙන් අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේ කෙනෙක් වූ අවස්ථාවකදී එකී ත්‍යාග මුදල ජයග්‍රාහි ප්‍රතිලාභියා වෙත ලබා දිමට ක්‍රියා කළ යුතුය. උපැවිදිවීමකදී ජයග්‍රාහී ත්‍යාග මුදල ලබා නොදෙනු ඇත.

21. ත්‍යාග ලබාදෙන අවස්ථාව වන විට ත්‍යාගලාභියා මිය ගොස් සිටී නම් ප්‍රාදේශීය ලේකම් වරයා විසින් කරනු ලබන පරීක්ෂණයකින් අනතුරුව මියගිය ප්‍රතිලාභියාගේ කලත්‍රයාට හෝ එම ප්‍රතිලාභී පවුලේ වඩාත් සුදුසු යැපෙන්නාට (අවිවාහක හෝ බාල වයස්කාර දරුවන්) වෙත ලබාගැනීමට හිමිකම් ඇත.

22. තනිපුද්ගල සහනාධාරලාභියකු වූ අවස්ථාවේදී ඔහු හෝ ඇය මිය ගිය විට ඒ සඳහා කිසිවකුට හිමිකම් කිව නොහැකි වන්නේය.

23. ලබාදෙනු ලබන ත්‍යාග මුදල ප්‍රතිලාභියාගේ පදිංචි නිවස වැඩි දියුණු කිරීම, නව නිවසක් ඉදිකිරීම, ඉඩමක් මිලදී ගැනීම, ස්ථිර නිවසකට හිමිකම් පවතින අවස්ථාවක එම ත්‍යාග මුදල ආදායම් උත්පාදන ව්‍යාපෘතියකට යෙදවීම සඳහා යන එක් කාර්යයකට පමණක් යෙදවිය හැකි අතර, මෙම ත්‍යාග මුදල වෙනත් කාර්යයක් සඳහා යොදවන්නේ නම් ඒ පිළිබඳව ත්‍යාග ලාභියාගේ ඉල්ලීම අනුව සමෘද්ධි ප්‍රාදේශීය නිලධාරීන්ගේ නිර්දේශ යටතේ ප්‍රාදේශීය ලේකම් වෙත තීරණ ගැනීමේ බලතල පැවරේ.

එසේම

I. යම් ජයග්‍රාහී පුද්ගලයකු වයස අවු: 60 ඉක්මවා සිටින විටක ඔහු හෝ ඇය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්, සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා සුදුසු පරිදි ත්‍යාග මුදල් නිදහස් කිරීම

II. ජයග්‍රාහී ප්‍රතිලාභියා හෝ එම පවුලේ යැපෙන්නෙකු සුව කළ නොහැකි විශේෂ රෝගාබාධයකින් පෙලෙන විටක හෝ විශේෂ සැත්කමක් සිදු කිරීමට වෛද්‍යවරුන් නිර්දේශ කර ඇති විටක අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා මුදල් නිදහස් කිරීමට හැකි වන්නේය.

24. විදේශ ගතවීමකදී ප්‍රතිලාභියා විදේශ ගත වී වසර 03 සඳහා පමණක් ත්‍යාග මුදල ලබාදිය හැකිය. එසේ නොවන අවස්ථාවලදී ත්‍යාග මුදල ගිණුමට බැර කරනු ඇත.

25. ප්‍රාදේශීය ලේකම්වරු විසින් ලොතරැයි ජයග්‍රාහකයින්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසු අදාල දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ගේ පූර්ණ අධීක්ෂණයට යටත්ව ත්‍යාග නිදහස් කිරීමේ කටයුතු සිදුකළ යුතු වන්නේය.

26. මෙතෙක් ත්‍යාගලාභීන්ගේ ත්‍යාග ලබාදීමේ බලය ප්‍රධාන කාර්යාලය වෙත පැවරුන අතර 2014/2015 දිණුම් වාරයේ සිට දිස්ත්‍රික් සමෘද්ධි අධක්ෂවරුන් වෙත ත්‍යාග ලබාදීමේ බලය විමධ්‍ය ගත කරනු ලැබේ.

27. සෑම දිනුම් ඇදීමක්ම අවසාසනයේ එම දිනුම් ඇදීම සිදුකළ දින සිට මාස 3ක් ගතවන කල් පමණක් ත්‍යාග ලබාදීම සිදුකළ යුතුය. ලබාදීමට අපොහොසත් වන ත්‍යාග සඳහා ඉතිරි වන මුදල් එම කාලසීමාව අවසානයේ ප්‍රධාන කාර්යාලයේ නිවාස ලොතරැයි අරමුදල් ගිණුමට බැර කළ යුතුය.

28. සෑම දිනුම් ඇදීමක්ම ජාතික ලොතරැයි මණ්ඩලය, ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, සමෘද්ධි දෙපාර්තමේන්තුව අයත් වන අමාත්‍යාංශය, සමෘද්ධි දෙපාර්තමේන්තුව යන නිලධාරීන්ගෙන් සමන්විත අධික්ෂණ මණ්ඩලයක් ඉදිරිපිට සිදුකළ යුතු වන්නේය.

29. සෑම දිනුම් ඇදීමකදීම, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ හා ජාතික ලොතරැයි මණ්ඩලයේ හා සමෘද්ධි දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු අනිවාර්යයෙන්ම ඇතුලත් විය යුතුය.

30. සෑම දිනුම් ඇදීමේ අවස්ථාවකදීම අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකුට එක් දිනුම් ඇදීම් වාරයක් වෙනුවෙන් භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මුදලක් අධීක්ෂණ මණ්ඩල දීමනාවක් වශයෙන් ගෙවිය යුතුවන්නේය. එකී ගෙවීම් කලින් කලට සුදුසු පරිදි සංශෝධනය කිරීමට භාරකාර මණ්ඩලයට බලය ඇත්තේය.

31. භාරකාර මණ්ඩලයට අවශ්‍ය පරිදි කලින් කලට ඉහත සඳහන් රෙගුලාසි සංශෝධනය කිරීමට හෝ නව රෙගුලාසි පැනවීමට හෝ එම භාරකාර මණ්ඩලයට බලය ඇත්තේය.

**සැලකිය යුතු කරුණු**

1. නිවසක් ඉදි කරන්නේ නම් හෝ අළුත්වැඩියාවක් සඳහා නම් රු. ලක්ෂය බැගින් දෙවතාවකදී මුදල් නිදහස් කිරීම
2. ඉඩමක් මිලදී ගැනීම හෝ ස්වයං රැකියාවක් සඳහා, වාහනයක් මිලදී ගැනීම සඳහා අදාල මුදල යොදවන්නේ නම් එකවර රු. ලක්ෂ 02කම ලබාදීම
3. අවු. 60ට වැඩි ප්‍රතිලාභීන් සඳහා නිවසක් ඉදිනොකරන්නේ නම් අවශ්‍යතාවය අනුව මුදල් නිදහස් කිරීම
4. පිරවෙන් අධ්‍යාපනය ලබන ස්වාමීන්වහන්සේලාගේ ඉල්ලීමකට අනුව හතර වතාවකදී මුදල් නිදහස් කිරීම (විශේෂයෙන් අධ්‍යාපන කටයුතු)